# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජනවාරි 2017

## (AA35) සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

---

**ප්‍රශ්න අංක 01** (ලකුණු 05)

"නැනැත්තා" සහ "තක්සේරු වර්ෂය" යන පද පිළිබඳ අයදුම්කරුවන්ගේ සමස්ත දැනුම ඉතා දුර්වල මට්ටමක විය. මෙම මූලික සංකල්ප නොමැතිව බදුකරණය පිළිබඳව සිතීම පවා සිහිනයක් වේ.

බොහෝ අයදුම්කරුවන් "දින 183 නීතිය" පිළිබඳව සිතමින් නැනැත්තා යන්නෙහි අර්ථ නිරූපණය නැනැත්තෙකුගේ වාසිකභාවය සමග පටලවාගෙන තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**ප්‍රශ්න අංක 02** (ලකුණු 05)

උපයනවිට ගෙවීම් බදු (PAYE) ක්‍රමය ක්‍රියාත්මක කිරිමේදී සේවායෝජකයෙකුගේ වගකීම් පිළිබඳව බොහෝ අයදුම්කරුවන්ට අදහසක් නොතිබුණි.

- PAYE ගෙවීමට නියමිත දිනය,
- වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය,
- T10 සහතිකය ඉදිරිපත් කළ යුතු දිනය,

ආදිය පිළිබඳව බොහෝ අයදුම්කරුවන් දැනුවත්ව නොසිටි බව දී තිබූ උත්තර වලින් පැහැදිලි විය.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

**ප්‍රශ්න අංක 03** (ලකුණු 05)

සාමාන්‍යයෙන් පසුගිය විභාගවලදී අයදුම්කරුවන්ගේ නඩුතීන්දු පිළිබඳ දැනුම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

දේශීය ආදායම් පනතේ 217 වන වගන්තිය අනුව "වෙළදාම" යන්නෙහි අර්ථය හා "ඩී.එස්. මහවිතාරණ එදිරිව දේශීය ආදායම් කොමසාරිස් නඩුව" අතර සම්බන්ධය අයදුම්කරුවන් බොහෝ පිරිසක් නොදැන සිටියහ. සමහර අයදුම්කරුවන් "රාම් ඊශ්වර එදිරිව දේශීය ආදායම් කොමසාරිස් නඩුව" සමග දී ඇති නඩු තීන්දුවේ කරුණු පටලවාගෙන තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

**ප්‍රශ්න අංක 04** (ලකුණු 05)

එකතුකළ අගය මත බද්ද (VAT) පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට ඉදිරිපත් කර තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සැළකිය යුතු ලකුණු ලබාගැනීමට සමත්ව තිබුණි. නමුත් " 2016 ජනවාරි 20 දින කළ ගෙවීම" සඳහා වෙන්කර තිබූ ලකුණු ලබාගැනීමට සියලුම අයදුම්කරුවන් පාහේ අසමත්ව තිබුණි.

අයදුම්කරුවන් බහුතරය එම ගෙවීම පෙර කාර්තුවට අදාල බව නොසලකා හරිමින් කාර්තුවේ බදු වාරික ලෙස මුළු මුදලම අඩුකර තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **05** (ලකුණු 10)

පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට තිබෙන ක්‍රම පිළිබඳව (a) කොටසින් පරීක්ෂා කොට ඇත.

බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට පැහැරහරින ලද පුද්ගලයාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, පැහැරහරින ලද පුද්ගලයාගේ දේපළ කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරීම වැනි උත්තර අනුමාන කොට ලියා තිබුණි. නමුත් බොහෝ අවස්ථාවන්හිදී, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ගතහැකි අයකරගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳව බහුතරයක් අයදුම්කරුවන්ට සම්පූර්ණ දැනුමක් නොමැති බව ගම්‍ය විය.

**සමස්ථයක් වශයෙන් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය එතරම් සතුටුදායක නොවීය.**

දේශීය ආදායම් පනත අනුව "බලයලත් නියෝජිතයෙකු" වියහැකි තැනැත්තන් පිළිබඳව (b) කොටසින් පරීක්ෂා කර ඇත.

අයදුම්කරුවන් විසින් දී තිබූ පොදු වැරදි උත්තර කිපයක් පහත දැක්වේ:

- කොමසාරිස් ජනරාල් සහ වෙනත් දේශීය ආදායම් කොමසාරිස්වරු.
- ශ්‍රී ලංකා ජනාධිපති.
- අගවිනිසුරු සහ අභියාචනාධිකරණ විනිසුරුවන්.
- ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති.
- රජයේ සේවකයන්ගේ විවිධ නම් හා තනතුරු.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **06** (ලකුණු 10)

ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කොට ඇත. අයදුම්කරුවන් බහුතරය අවම වශයෙන් ලකුණු 10 න් 7 ක්වත් ලබාගෙන තිබුණි. NBT යෙදවුම් බදු අඩුකළ නොහැකි අවස්ථා පිළිබඳ දැනුම මදිකම සහ NBT වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය නොදැන සිටීම යන කරුණු නිසා ඉතිරි ලකුණු 3 අහිමි කරගෙන තිබුණි.

කාර්යාල වියදම් මත ගෙවූ NBT බොහෝ අයදුම්කරුවන් විසින් යෙදවුම් බදු බැරක් ලෙස අඩුකර තිබුණි.

ආසන්න වශයෙන් අයදුම්කරුවන්ගෙන් අඩක් පමණ NBT වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය පිළිබඳව දැනුවත්ව නොසිටි බව පැහැදිලි විය. මෙය පිළිගතහැකි තත්ත්වයක් නොවේ. මන්ද, අදාල වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය නොදැන NBT ගණනය කිරීම පිළිගත නොහැකි බැවිනි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **07** (ලකුණු 10)

හවුල් ව්‍යාපාර බදුකරණය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කොට ඇත. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ලකුණු 10 න් අවම වශයෙන් 6 සිට 8 දක්වා ලබාගෙන තිබුණි. බෙදාහැරිය හැකි ලාභය බෙදාහැරීම පිළිබඳ දැනුම නොමැතිවීම නිසා ඉතිරි ලකුණු අහිමිව තිබුණි.

සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් හවුල් ව්‍යාපාර බදු අනුපාතය පුද්ගල බදු අනුපාත සමග වරදවා වටහාගෙන තිබූ අතර, ඒ අනුව ඔවුන් හවුල් ව්‍යාපාර බද්ද ගණනය කිරීමට 4% සිට 24% දක්වා වන පුද්ගල බදු අනුපාත භාවිත කර තිබුණි.

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, හවුල් ව්‍යාපාරයක ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී හවුල්කරුවන්ගේ වේතන හෝ වෙනත් සංවේතන කිසිවක් අඩු කළ නොහැක. කෙසේවුවත්, මේ පිළිබඳව නොදැන සිටි අයදුම්කරුවන් ගෙවූ වෘත්තීය ගාස්තු හවුල් ව්‍යාපාරයේ ලාභය සෙවීමේදී ඉඩදිය හැකි වියදමක් ලෙස සලකා ඉඩදී තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**ප්‍රශ්න අංක 08** (ලකුණු 25)

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා 2016 මාර්තු 31 දක්වා සංශෝධන අනුව සාංගමික ආදායම් බද්ද ගණනය කිරීම පරීක්ෂා කර තිබුණි. මුළු ව්‍යාවස්ථාපිත ආදායම, තක්සේරු කළ හැකි ආදායම, බදු අයකළ හැකි ආදායම, දළ ආදායම් බද්ද සහ ඉතිරි ගෙවිය යුතු බද්ද ගණනය කිරීම සඳහා වෙන වෙනම ලකුණු වෙන්කර තිබුණි.

ගණනය කිරීම සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි ආකෘති භාවිත කර තිබුණද, අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් නිවැරදි ආකෘති භාවිත කර නොතිබුණි. හඳුනාගත් පොදු වැරදි පහත දැක්වේ:

- දඩය අඩුකර ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම වෙනුවෙන් බදු උපදේශකවරයාට ගෙවූ නීති ගාස්තු ආදායම් ජනනය කිරීමේදී දරණ ලද්දක් සේ සැලකිය නොහැක. එමනිසා එයට ඉඩදිය නොහැක. නමුත් බහුතරයක් අයදුම්කරුවන් එයට ඉඩදී තිබුණි.

- ප්‍රධාන විධායක නිළධාරියාට ලබා දී තිබූ කුලී රහිත වාසස්ථානයට අදාලව ඉඩ නොදෙන කුලියෙහි කොටස පහත පරිදි ගණනය කළ යුතු විය:

  | | | |
  |---|---|---|
  | 318,000 - 180,000 | = | 138,000 |
  | 138,000 X 75% | = | 103,500 |

  කෙසේවෙතත්, බහුතරයක් අයදුම්කරුවන් විසින් මෙම ගැලපුම නිවැරදිව සිදුකර නොතිබුණි.

- කල්බදු ගැලපුම පහත පරිදි වේ:

  | | | | | |
  |---|---|---|---|---|
  | මුළු කල්බදු වටිනාකම | = | 44,000 X 60 | = | 2,640,000 |
  | මුළු කල්බදු වටිනාකමෙන් $\frac{1}{5}$ | = | 2,640,000 X $\frac{1}{5}$ | = | 528,000 |
  | ගෙවූ කල්බදු වාරික | | | = | 440,000 |

  මේවායින් අඩු අගය අඩුකිරීමට ඉඩදේ.

  බහුතරය මෙම ගැලපුම නිවැරදිව කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් ගෙවූ කල්බදු පොලී සඳහා ද ඉඩදී තිබුණි.

- සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ක්ෂය දීමනා නිවැරදිව ගණනය කර නොතිබුණි. සමහරු ක්ෂය දීමනා ගණනය කිරීමට වැරදි අනුපාත භාවිත කර තිබුණි. තවත් සමහරු කල්බදු වත්කම් සඳහා ද ක්ෂය දීමනා ගණනය කර තිබුණි.

- සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් රු.500,000/- ක් හෝ තක්සේරු කළ හැකි ආදායමෙන් $\frac{1}{5}$ යන අගයන්ගෙන් වඩා අඩු අගය යන සීමාව කෙරෙහි අවධානය යොමු නොකරමින් බදු අයකළ හැකි ආදායම ලබාගැනීමේදී මුළු පරිත්‍යාගය වූ රු.600,000/- ම සුදුසුකම් ලබන දීමනාවක් ලෙස අඩුකර තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**ප්‍රශ්න අංක 09** (ලකුණු 25)

2015/16 තක්සේරු වර්ෂය සඳහා පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කොට ඇත. බොහෝ අයදුම්කරුවන් ඉතා හොඳින් ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. කෙසේ වෙතත්, ගුවන් ටිකට්පත් පිරිවැය, වෛද්‍ය සමුළුව සඳහා නවාතැන් පහසුකම් වැනි සමහර ආදායම් බද්දට යටත් නොවීමට හේතු සඳහන් නොකිරීම නිසා ලකුණු අහිමි කර ගෙන තිබුණි.

පහත දැක්වෙන පොදු වැරදි හඳුනාගෙන තිබුණි:

- බොහෝ අයදුම්කරුවන් නිවසේ ශුද්ධ කුලී ආදායම එහි ශුද්ධ වාර්ෂික වටිනාකම සමග සසඳා නොතිබුණි. ඔවුන් ශුද්ධ වාර්ෂික වටිනාකම සමග සැසඳීමෙන් තොරව ශුද්ධ කුලිය පමණක් දේපල ආදායම ලෙස දක්වා තිබුණි.
- මෝටර් රථය විකිණීම ප්‍රාග්ධන ස්වරූපයේ ගනුදෙනුවක් වන අතර ඒ නිසා බද්දට යටත් නොවේ. කෙසේ වෙතත්, මෝටර් රථය විකිණීමේ ලාභය බද්දට යටත් ලෙස සැලකූ අයදුම්කරුවන් ද විය.
- සමහර අයදුම්කරුවන් සේවා නියුක්තික ආදායම මත සුදුසුකම් ලබන දීමනාව වන රු.250,000/- බදු අයවන ආදායම ලබා ගැනීමේ දී අඩුකර නොතිබුණි.
- හෙට්ටිගේගේ ආදායම් බදු බැඳියාව ගණනය කිරීමට සමාගම් බදු අනුපාතය වන 28% භාවිතා කළ අයදුම්කරුවන් ද සුළු පිරිසක් විය.
- ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද ලබාගැනීමේ දී ස්ව තක්සේරු මත බදු ගෙවීම් සහ උපයන විට ගෙවූ බදු අඩු කිරීමට සමහර අයදුම්කරුවන්ට අමතකව තිබුණි.

සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය. අයදුම්කරුවන් ප්‍රශ්නයේ දී ඇති කරුණු ඉතා ප්‍රවේශමෙන් කියවූයේ නම්, ඔවුන්ට වැඩි ලකුණු ලබාගැනීමට හැකියාව තිබුණි.

- - -

**කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ:**

**(1) ප්‍රශ්නයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර කාලය වෙන්කිරීම පිළිබඳව සැලකිල්ලට ගත යුතුය. නව විෂය නිර්දේශයට අනුව මෙම ප්‍රශ්නවල බරතැබීම බොහෝ අයදුම්කරුවන් නොසලකා හැර තිබුණි.**

**(2) මෙම කුසලතා වර්ධනය කරගැනීමට අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට පෙර සිට පසුගිය විභාග ප්‍රශ්න වැඩි වැඩියෙන් පුහුණු වීම, අධ්‍යයන පෙළ පොත් කියවීම,සමාන විභාගවල පසුගිය විභාග ප්‍රශ්න පුහුණු වීම කළ යුතුය. මෙය අයදුම්කරුවන්ට විෂය නිර්දේශයේ විෂය පථය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට උපකාර වනු ඇත.**

**(3) අයදුම්කරුවන් විසින් ප්‍රශ්නයක් අවබෝධ කර ගැනීමට සහ ඒවා විශ්ලේෂණය කිරීමට ක්‍රමයක් පුහුණු විය යුතුය. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය කියවන අතරම මෙම විශ්ලේෂණය සිදු කර තිබුණි. මෙය ප්‍රශ්නය හරියාකාරව අවබෝධ කර ගැනීමටත් පිළිතුර ඉදිරිපත් කිරීමට නිවැරදි ආකෘතිය තෝරා ගැනීමටත් උපකාර වේ. උදාහරණ වශයෙන්, ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ බදු සඳහා ගලපන ලද ලාභය ගණනය කිරීම නම්, බදු පෙර ශුද්ධ ලාභයට එකතු කිරීම් සහ අඩු කිරීම් සඳහා තීරු දෙකක් අවශ්‍ය වේ. නිවැරදි ආකෘතිය තෝරාගැනීම පැහැදිලි සහ සම්පූර්ණ පිළිතුරක් ඉදිරිපත් කිරීමටත් වැරදි අඩු කර ගැනීමටත් උපකාර වේ. එය විභාග පරීක්ෂකවරයාට ව්‍යාකූලත්වයකින් තොරව වෙන් කළ ලකුණු ලබා දීමටත් උපකාර වේ.**

- * * * -